චක්‍රලේඛ අංක:- 10/2007(1)

මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්/2007
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ - 08.
2007.07.02

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ස.ණ.ස. සමිති හා බස්නාහිර පළාතේ ලියාපදිංචි
සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත.

2007.06.01 දින සිට බ.ප. සමුපකාර සේවකයින් සඳහා
නව වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම

ඉහත සඳහන් 10/2007 චක්‍රලේඛය පරිදි වැටුප් පරිවර්තනය සම්බන්ධයෙන් පවත්නා ගැටළු විටින් විට විමසන බැවින් පහත සඳහන් උපදෙස් පරිදි වැටුප් ප්‍රතිශෝධනය විය යුතුය. 10/2007 චක්‍රලේඛයේ 04 ඡේදය මේ අනුව අවලංගු කරනු ලැබේ.

01. දැනට ලබන වැටුප් පරිමාණයේ උපභෝගන ඇති වැටුප් පියවර සංඛ්‍යාවට අනුරූප නව වැටුප් පියවරේ සේවකයින් තැබිය යුතුය. නිදසුන් වශයෙන් යම් සේවකයෙකු පවත්නා වැටුප් පරිමාණයේ පියවර 05 ක් ලබා ඇතොත් ඔහු නව වැටුප් පරිමාණයේ 05 වන පියවරේ රැඳවිය යුතුය.

02. දැනට ගෙවනු ලබන අතිරේක දීමනා ලාභය පදනම් කර ගෙන ගෙවනු ලබන ප්‍රසාද දීමනා වශයෙන් සැලකෙන නිසා එම දීමනා නව වැටුපට එකතු නොකළ යුතුය. ලාභය පදනම් කරගෙන එම දීමනා ඉදිරියට ද ගෙවිය හැකිය.

03. වැටුප් වර්ධක දිනයේ වෙනසක් නොවනු ඇත.

04. යම් සේවකයෙකු අවසන් වරට වැටුප් වර්ධකය ලබා ගත් දින සිට උපරිම වැටුප් පියවරේ වසර 03 ක කාලයක් රැඳී සිටිය හොත් එම වසර 03 සඳහා එක් වැටුප් වර්ධකයක් ද ඉදිරියේ දී වසර 02 ක කාලයක් සඳහා එක් වැටුප් වර්ධකය බැගින් ද නව වැටුප් පරිමාණයේ උපරිමය ඉක්මවා වැටුප් වර්ධක ගෙවිය හැකිය.

05. කොන්ත්‍රාත් පදනම මත සිටිනා සේවකයින් සඳහා දැනට ක්‍රියාත්මක ගිවිසුම්ගත වැටුප ගෙවිය යුතුය.

06. විනයානුකූල දඬුවම් මත වැටුප් වර්ධක විලම්භනය කර හෝ වෙනත් අන්දමින් වැටුප් වර්ධක නතර කර ඇති හෝ සේවකයින් නව වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය කළ යුත්තේ ඔවුන් දැනට ලබන වැටුප් පියවරට සමාන නව වැටුප් පියවරෙහි තැබීමෙනි.

07. වැඩ බැල්මේ වැටුප් තීරණය කිරීමේ දී 2001.06.27 දිනැති 1/2001 සම්බන්ධව පැහැදිලි කිරීම් චක්‍රලේඛයේ 11, 12, 13 සහ 14 ඡේද වල සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.

09. කාර්ය විධි විධාන සංග්‍රහයේ 1.7.2 (අ), (ආ) සහ (ඇ) වගන්ති යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය සහිතව බඳවා ගනු ලැබූ තාවකාලික සේවකයින්ට ද මෙම වැටුප අදාළ කර ගත හැකිය. 1.7.2 (ඇ) වගන්තිය කෙරෙහි ද අවධානය යොමු විය යුතුය.

10. වැඩ තනතුර යටතේ අඩ වැටුප් ලබන සේවකයින් සඳහා ද නව වැටුප් ක්‍රමය අදාළ නොවන අතර, ඔවුනට දැනට ගෙවන අඩ වැටුප ගෙවිය යුතු වේ.

11. රාජකාරි ගමන්වල දී පැය 24 ක අඛණ්ඩ කාලයක් ගතවන අවස්ථාවල දී 2001.06.27 දිනැති 1/2001 සම්බන්ධව පැහැදිලි කිරීම් චක්‍රලේඛයේ 07 ඡේදයේ සඳහන් පරිදි 25% ක අතිරේක සැපිම් දීමනාවක් හිමි වේ.

මෙම උපදෙස් සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පැන නැගුන හොත් කොමිෂන් සභාවේ පැහැදිලි කිරීම් ලබාගත හැකිය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

කේ. කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාත්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ. ප.)
3. ලේකම්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය (බ. ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ. ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, ගම්පහ, කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්

මගේ අංකය:- පප/සංස්ථා/වේතන/[illegible]
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක 50, මිදුල් වත්ත පාර,
කොළඹ 08.
2004.12.28

බස්නාහිර පළාතේ පියවුම් අනුමත සමිති,
සභාපතිවරුන් වෙත,

208:14 වැ.ප. හා 208.15 වැ.ප.
වැටුප් පුහුණුකම් සංශෝධනය

ඉහත සඳහන් කරනු ලැබූ පුහුණුකම් සංශෝධනය කරමින් කොමිෂන් සභාව විසින් තීරණ කර ඇති චක්‍රලේඛ අංක 01/2003 යටතේ ඒ ඒ තනතුරු සඳහා වන වැටුප් ක්‍රම පහත සඳහන් පරිදි නිවැරදි කරනු ලැබේ.

(1) 208:14 – 44400-1020X10-1080X8-63240

(2) 208:15 – 43200-960X10-1020X8-60960

මෙයට - විශ්වාසී,

ජේ. එල්. පිරිසේන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. සියළුම වාණිජ සමිති